27967

AL/2026/45/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

| | | |
|---|---|---|
| **බෞද්ධ ශිෂ්ටාචාරය I**<br>பௌத்த நாகரிகம் I<br>Buddhist Civilization I | **45 S I** | *පැය දෙකයි*<br>*இரண்டு மணித்தியாலம்*<br>*Two hours* |

**උපදෙස්:**

※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
※ පිළිතුරු පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
※ පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
※ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **ඉතාමත් ගැළපෙන** පිළිතුර තෝරාගෙන එය **පිළිතුරු පත්‍රයේ දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** චතුර් වර්ණයේ ප්‍රභවය අවධාරණය කොට ඇති ප්‍රමුඛ හා පැරණිත ම මූලාශ්‍රය ලෙස සැලකිය හැක්කේ
(1) ඍග්වේදයයි.
(2) යජුර්වේදයයි.
(3) සාමවේදයයි.
(4) අථර්වවේදයයි.
(5) භගවත්ගීතාවයි.

**2.** පැරණි භාරතීය බ්‍රාහ්මණ සම්ප්‍රදාය විසින් සමාජගත කරන ලද කුල භේදය බුදුසමය විසින් ජීව විද්‍යාත්මක ආදී විවිධ සාධක ඉදිරිපත් කරමින් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එහිලා ඓතිහාසික සාධක ඇතුළත් වන්නේ
(1) අම්බට්ඨ සූත්‍රයේ ය.
(2) අග්ගඤ්ඤ සූත්‍රයේ ය.
(3) මධුර සූත්‍රයේ ය.
(4) අස්සලායන සූත්‍රයේ ය.
(5) වසල සූත්‍රයේ ය.

**3.** ස්ත්‍රිය බාලවියේදී දෙමාපියන් යටතේ ද තුරුණු වියේදී ස්වාමි පුරුෂයා යටතේ ද මහලු වියේදී වැඩිමහල් පිරිමි දරුවා යටතේ ද විසිය යුතු යැයි බ්‍රාහ්මණයන් විසින් අවධාරණය කරන ලද්දේ
(1) තත්කාලීන සමාජයේ පැවති අනාරක්ෂිත බව නිසා කාන්තාවට අනතුරු සිදුවිය හැකි බැවිනි.
(2) කුඩා කල පටන් පතිදම් රැකීමට පුහුණු විය යුතු බැවිනි.
(3) ස්ත්‍රියට රැකවරණය සැලසිය හැක්කේ පුරුෂයකුට පමණක් ය, යන පිළිගැනීමක් පැවති බැවිනි.
(4) ස්ත්‍රියට දෑඟුලක නුවණක් පමණක් ඇතැයි සම්මතයක් පැවති බැවිනි.
(5) ස්ත්‍රියට ස්වාධීනව කටයුතු කිරීමට ඉඩ සලසා නොදිය යුතු යැයි පිළිගත් බැවිනි.

**4.** මරණින් මතු සත්ත්වයාගේ සතර මහාභූත විශ්වයේ සතර මහාභූතවලට එකතු වන බවත් බාල පණ්ඩිත සියලුදෙනා මරණයෙන් කෙළවරට පත් වන බවත් ඉගැන්වූ බුද්ධකාලීන ශාස්තෘවරයා වූයේ
(1) අජිත කේසකම්බල ය.
(2) පූරණ කස්සප ය.
(3) පකුධ කච්චායන ය.
(4) සංජය බෙල්ලට්ඨිපුත්ත ය.
(5) මක්ඛලි ගෝසාල ය.

**5.** භාරතීය පාලකයන් හා බුදුරජාණන් වහන්සේ අතර පැවති සබඳතා තහවුරු වන ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A – රාජ භටයන් පැවිදි නොකළ යුතු යැයි විනය ප්‍රඥප්තියක් පැනවීම
B – බුදුසසුනට ප්‍රථම ආරාම පූජාව සිදුකිරීම
C – තුන්බිය දුරු කිරීමට රතන සූත්‍රය දේශනා කිරීම
D – කූටාගාර ශාලාවේදී භික්ෂුණී ශාසනය ඇරඹීම
E – පෞද්ගලික ජීවිතයේ කරුණු සම්බන්ධයෙන් පවා බුදුරදුන් සමග සාකච්ඡා කිරීම

ඉහත ප්‍රකාශ අතුරින් බුදුරදුන් හා සමකාලීන රාජාණ්ඩු පාලකයන් අතර පැවති සබඳතා පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) A, B හා C
(2) A, B හා E
(3) A, D හා E
(4) B, C හා D
(5) C, D හා E

[දෙවැනි පිටුව බලන්න

Past Papers Wiki



**6.** මහාපරිනිබ්බාන සූත්‍රයේ දැක්වෙන අපරිහානිය ධර්මවලට අනුගතව රාජ්‍ය පාලනය ගෙන ගිය බුද්ධකාලීන රාජ්‍යය වූයේ

(1) මල්ල රාජ්‍යයයි.
(2) වජ්ජි රාජ්‍යයයි.
(3) මගධ රාජ්‍යයයි.
(4) වත්ස රාජ්‍යයයි.
(5) උදේන රාජ්‍යයයි.

**7.** බුද්ධකාලීන භාරතීය සමාජය තුළ කාන්තාවට බුදුසමයෙන් හිමිව පැවති තත්ත්වය ප්‍රකට වන පහත සඳහන් ප්‍රකාශ අතුරින් බුදුසමයට අනුගත **නොවන්නේ**,

(1) ගුණනුවණින් හෙබි ඇතැම් කාන්තාවන් ද ශ්‍රේෂ්ඨ ය, යන්නයි.
(2) ප්‍රඥා ප්‍රතිලාභයට හා ආධ්‍යාත්මික ප්‍රගතියට ස්ත්‍රීත්වය බාධාවක් නොවේ, යන්නයි.
(3) මවක වශයෙන් ස්ත්‍රිය පූජනීයත්වයට පත් කොට ඇත, යන්නයි.
(4) තනතුරු ප්‍රදානය කිරීමේදී කාන්තාවට ප්‍රමුඛතාව ලබා දී ඇත, යන්නයි.
(5) විවිධ ශක්‍යතා ඇති ස්ත්‍රීන් බුදුරදුන්ගේ ඇගයීමට ලක්ව ඇත, යන්නයි.

**8.** "මිනිස් වර්ගයාගෙන් වැඩිම සංඛ්‍යාවකින් පූජා ලද තැනැත්තා ලෙස ඉතා පහසුවෙන් ම වෙන් කොට දැක්විය හැක්කේ බුදුරජාණන් වහන්සේ ය." ඉහත ප්‍රකාශය කවුරුන් විසින් සිදුකරන ලද්දක් ද?

(1) ශ්‍රී ජවහර්ලාල් නේරු
(2) ඇල්බට් අයින්ස්ටයින්
(3) මැක්ස් මුලර්
(4) මහාචාර්ය සෝණ්ඩර්ස්
(5) බර්ට්‍රන්ඩ් රසල්

**9.** බුදුරජාණන් වහන්සේගේ උදාර නායකත්වය හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A – සිවුවනක් පිරිස ව්‍යක්ත, විනීත, විශාරද, බහුශ්‍රැත, ධර්මධර, ධර්මානුධර්ම ප්‍රතිපන්න පිරිසක් වන තුරු තමන් වහන්සේ, පිරිනිවන් නොපාන බව මාරයාට දැන්වීම
B – සුපිරිසිදු චරිතයකින් යුක්ත වීම
C – යථාවාදී තථාකාරී හා යථාකාරී තථාවාදී වීම
D – විවේචනවලට බිය නොවී නිර්භීතව ඕනෑම අභියෝගයකට නොසැලී මුහුණ දීම
E – විමසීමට, ප්‍රශ්න කිරීමට, නිදහස් චින්තනයට ඉඩ ලබා දීම

ඉහත ප්‍රකාශ අතුරින් බුදුරදුන්ගේ නායකත්ව ගුණාංග පිළිබඳ වඩාත් නිවැරදි වරණය කුමක් ද?

(1) A, B හා C පමණි.
(2) A, C හා D පමණි.
(3) B, C හා D පමණි.
(4) B, C, D හා E පමණි.
(5) A, B, C, D හා E යන සියල්ලම ය.

**10.** යහපත් කොට යෙතැයි
සුන්දර තැනට සැපතැයි
සොඳුරු බස් කියතැයි
........................ ................

බුදුගුණාලංකාරයේ එන ඉහත සඳහන් කවියෙන් විස්තර වන බුදුගුණය කුමක් ද?

(1) සත්ථා
(2) ලෝකවිදූ
(3) සුගත
(4) බුද්ධ
(5) භගවා

**11.** බුදුරජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය පිළිබිඹු කෙරෙන නව අරහාදි බුදුගුණ අතුරින් 'අරහං' බුදුගුණයේ නිර්වචනය හා **නොගැළපෙන** ප්‍රකාශය වනුයේ

(1) සියලු කෙලෙසුන්ගෙන් මිදුණු සේක, යන්නයි.
(2) රහසින්වත් පව් නොකළ සේක, යන්නයි.
(3) සියල්ල අවබෝධ කළ සේක, යන්නයි.
(4) සියලු පුද පූජාවන්ට සුදුසු වන සේක, යන්නයි.
(5) සංසාර චක්‍රයේ අර සිඳලූ සේක, යන්නයි.

**12.** ගේහසිත සීලය යනු කුමක් ද?

(1) පඤ්ච ශීලය හා ගිහියන් විසින් රැකිය යුතු ශීලයයි.
(2) අෂ්ටාංග ශීලයයි.
(3) දස සීලයයි.
(4) ගෘහස්ථ බ්‍රහ්මචර්යාවයි.
(5) පස්කම් සැප නොසෙවීමයි.

[තුන්වැනි පිටුව බලන්න

**13.** බෞද්ධ දේශපාලන මූලධර්ම අතර ප්‍රමුඛ ඉගැන්වීමක් වන දස රාජධර්මවල ඇතුළත් 'අජ්ජව' යන්නෙන් අදහස් වන්නේ

(1) එදිනෙදාට නියමිත කටයුතු එදිනම අවසන් කිරීමට තීරණය කිරීමයි.
(2) අගතිගාමී නොවී නිසි තැන නිසි තීරණ ගැනීමයි.
(3) නීතිය ක්‍රියාවේ යෙදවීමට දැඩි තීරණ ගත යුතු ය, යන්නයි.
(4) පවතින තත්ත්වයන්ට අනුව තීරණ සංශෝධනය කළ යුතු ය, යන්නයි.
(5) පාලකයාගේ තීරණ කිසි ලෙසකින් හෝ වෙනස් නොකළ යුතු ය, යන්නයි.

**14.** දීඝනිකායේ මහාපරිනිබ්බාන සූත්‍රයේ දැක්වෙන බෞද්ධ දේශපාලන මූලධර්මයක් වන සප්ත අපරිහානිය ධර්මවල ඇතුළත් "වැඩිහිටියන්ට ගරු බුහුමන් කිරීම හා ඔවුන්ගේ වචනවලට සවන් දීම සිදුකළ යුතු ය." යන්නෙන් අර්ථ ගැන්වෙනුයේ

(1) වැඩිහිටි ප්‍රජාවගේ ආහාර, සෞඛ්‍ය වැනි මූලික අවශ්‍යතා සපුරාලිය යුතු ය, යන්නයි.
(2) හුනස්නෙන් නැගී සිටීම් ආදී ගෞරව සම්ප්‍රයුක්තව පැවතිය යුතු ය, යන්නයි.
(3) රාජ්‍ය පාලනයට වැඩිහිටි ප්‍රජාවගේ ඍජු දායකත්වය ලබා ගත යුතු ය, යන්නයි.
(4) වැඩිහිටි ප්‍රජාවට ගෞරව සම්ප්‍රයුක්ත වීම හා බහුශ්‍රැත භාවයෙන් යුතු අත්දැකීම් බහුල වැඩිහිටියන්ගේ අවවාද අනුශාසනා පිළිගත යුතු ය, යන්නයි.
(5) වැඩිහිටිභාවයට පත්, රාජ්‍ය සේවයෙන් නිදහස් ප්‍රජාව වෙත නිති බත් වැටුප් ලබා දිය යුතු ය, යන්නයි.

**15.** හිස් තැනට වඩාත් නිවැරදි පිළිතුර සඳහන් වරණය තෝරන්න.

බෞද්ධ ආචාර ධර්ම අනුව පුද්ගලයා හා ලෝකය පාලනය කරනු ලබන ඊශ්වර නිර්මාණවාදී පදාර්ථ කිසිවක් පිළිගනු නොලැබේ. ඒ අනුව ක්‍රියාවක් සිදු කිරීමට පෙර එකී ක්‍රියාවේ හොඳ-නරක විනිශ්චය කොට, තීරණය කිරීමට පුද්ගලයාට ප්‍රමාණවත් ස්වච්ඡන්දතාවක් ඇත. ස්වච්ඡන්දතාවෙන් යුතුව සචේතනිකව සිදු කරනු ලබන ක්‍රියාව පිළිබඳ .................................. පුද්ගලයා වෙත ම පැවරේ.

(1) විනිශ්චය
(2) වගකීම
(3) ස්වාමිත්වය
(4) සතිය
(5) වෑයම

**16.** කැඩපතකින් තමා ම තම සිරුර නිරීක්ෂණය කරන්නා සේ තම කායික, වාචසික හා මානසික ක්‍රියා ප්‍රත්‍යවේක්ෂා කළ යුතු බව සඳහන් වන සූත්‍රය කුමක් ද?

(1) ආධිපතෙය්‍ය සූත්‍රය
(2) නිබ්බේධික සූත්‍රය
(3) චූල්ලකම්මවිභංග සූත්‍රය
(4) මහාකම්මවිභංග සූත්‍රය
(5) අම්බලට්ඨිකරාහුලෝවාද සූත්‍රය

**17.** හිස්තැනට වඩාත් නිවැරදි පිළිතුර සඳහන් වරණය තෝරන්න.

පුද්ගලයාගේ ආධ්‍යාත්මික සුව සහනයට මෙන් ම සමාජ සාරධර්ම සංවර්ධනයට අදාළ වන බෞද්ධ ආචාර ධර්ම අතර "බොහෝ සැප සම්පත් අපේක්ෂා නොකොට අවම පරිභෝජනයෙන් තෘප්තිමත්වීම .................................." යනුවෙන් හැඳින්වේ.

(1) සන්තුට්ඨිතාව
(2) සුභරතාව
(3) අල්පේච්ඡතාව
(4) අප්පකිච්චතාව
(5) සල්ලහුකවුත්ති

**18.** බෞද්ධ ආචාර ධර්මවලට අනුව පුද්ගලයා විසින් සිදුකරනු ලබන ක්‍රියාව සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A – කායික ක්‍රියා තුනක් ද, වාචසික ක්‍රියා හතරක් ද, මානසික ක්‍රියා තුනක් ද වේ.
B – සෑම ක්‍රියාවක් ම සිත, කය, වචනය යන තිදොරින් සිදු වේ.
C – දැඩි ලෝභකමින් වැළකීම, ක්‍රෝධ නොකිරීම හා වැරදි දැකීමෙන් වැළකීම කුසල පක්ෂය නියෝජනය කරයි.
D – මිථ්‍යා දෘෂ්ටියෙහි ප්‍රතිවිරුද්ධ අංශය වන සම්‍යග් දෘෂ්ටිය නිවනට මග හෙළිකරයි.
E – අකුසල ක්‍රියා තුළින් අයහපත් ප්‍රතිඵල ලැබෙන අතර කුසල ක්‍රියා තුළින් යහපත් ප්‍රතිඵල ලැබේ.

ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් කුසල් අකුසල් පිළිබඳ බෞද්ධ විග්‍රහයට අදාළ වන්නේ

(1) A, B, C හා D පමණි.
(2) A, B, D හා E පමණි.
(3) A, C, D හා E පමණි.
(4) B, C, D හා E පමණි.
(5) A, B, C, D හා E යන සියල්ලම ය.

Past Papers Wiki



19. ධනෝපායනය හා ධන පරිභෝජනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අනුව උට්ඨාන වීර්යයෙන් උපයාගත් ධනය පරිභෝජනය කිරීමේ සැපය හඳුන්වන්නේ

(1) අත්ථි සුඛය නමිනි. (2) කාම සුඛය නමිනි.
(3) ගිහි සුඛය නමිනි. (4) භෝග සුඛය නමිනි.
(5) ආමිස සුඛය නමිනි.

20. අසාහසිකව මෙන් ම දැහැමිව උපයාගත් ධනය මැනවින් කළමනාකරණය කර ගැනීම පිණිස භාවිත කළ හැකි බෞද්ධ ආර්ථික සිද්ධාන්තයක් ලෙස සැලකිය හැක්කේ

(1) සමජීවිකතාවයි. (2) සම්මා ආජීවයයි.
(3) ආරක්ඛ සම්පදාවයි. (4) අපාය මුඛවලින් වැළකීමයි.
(5) කල්‍යාණ මිත්‍රත්වයයි.

21. හිස්තැනට වඩාත් සුදුසු පිළිතුර සඳහන් වරණය තෝරන්න.

පත්තකම්ම සූත්‍රයේ දැක්වෙන පඤ්චබලි සංකල්පයට අනුව මියගිය ඥාතීන්ට පිං අනුමෝදන් කිරීම වෙනුවෙන් කරනු ලබන පරිත්‍යාගය ................................ නමින් හැඳින්වේ.

(1) යක්ඛ බලි (2) භූත බලි
(3) අතිථි බලි (4) පුබ්බපේත බලි
(5) ඤාති බලි

22. ස්වභාව සෞන්දර්යය නිරාමිසව අත්විඳි බුදුරජාණන් වහන්සේ ඇතැම් විට නිර්මාණාත්මක සෞන්දර්යය ද අගය කළ අවස්ථා සූත්‍ර සාහිත්‍යයෙන් පිළිබිඹු වේ. උන්වහන්සේ එසේ නිර්මාණාත්මක සෞන්දර්යය ඇගයීමට ලක් කළ අවස්ථාවක් ඇතුළත් සූත්‍රයක් වන්නේ,

(1) මහාපරිනිබ්බාන සූත්‍රයයි. (2) සක්කපඤ්හ සූත්‍රයයි.
(3) මහාපදාන සූත්‍රයයි. (4) ආටානාටිය සූත්‍රයයි.
(5) මහාසුදස්සන සූත්‍රයයි.

23. "තමා විසින් කරන ලද පව් විපාක දෙන තෙක් මෝඩයා, එය මී පැණි මෙන් මිහිරි කොට සලකයි." මෙම අර්ථය ඇතුළත් ධම්මපද ගාථාව තෝරන්න.

(1) යො බාලො මඤ්ඤති බාල්‍යං (2) මධුවා මඤ්ඤති බාලො
(3) යාව ජීවං පි චෙ බාලො (4) චරන්ති බාලා දුම්මෙධා
(5) යො ච වස්ස සතං ජීවෙ

24. පුද්ගලයාගේ මෙලොව හා පරලොව දියුණුව මෙන් ම නිර්වාණාවබෝධයට ද මග පෙන්වන ධර්ම කරුණු ඇතුළත් මහාමංගල සූත්‍රයෙහි 'අරියසච්චාන දස්සනං' යන්නෙන් අදහස් කරන්නේ

(1) ආර්ය සංවරයෙන් යුක්තවීම, යන්නයි.
(2) ආර්ය මාර්ගයේ ගමන් කිරීම, යන්නයි.
(3) චතුරාර්ය සත්‍යය දැකීම, යන්නයි.
(4) ආර්ය ශ්‍රාවකයන් දැකීම, යන්නයි.
(5) ආර්ය සත්‍යය දේශනා කිරීම, යන්නයි.

25. හිස්තැනට වඩාත් සුදුසු හා නිවැරදි වචනය සඳහන් වරණය තෝරන්න.

තරුණ විය ඉක්ම වූ පුද්ගලයකු නව යොවුන් තරුණියක ආවාහ කොටගෙන ඇය ගැන .............................. නොනිදා සිටී ද එය පිරිහීමට හේතුවකි.

(1) වෛරයෙන් (2) විමසිල්ලෙන්
(3) ඊර්ෂ්‍යාවෙන් (4) බියෙන්
(5) මුළාවෙන්

26. සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන පරිදි පුද්ගලයා විසින් වැළකිය යුතු කර්මක්ලේශවලට අයත් **නොවන** කරුණ වන්නේ

(1) සත්ත්ව ඝාතනයයි. (2) සොරකම් කිරීමයි.
(3) කාමමිථ්‍යාචාරයයි. (4) බොරු කීමයි.
(5) රහමෙර පානයයි.

**27.** සිගාලෝවාද සූත්‍රයේ සඳහන් ඒ ඒ දිශාවන්ට අයත් පුද්ගලයන් විසින් ඉටු කළ යුතු යුතුකම් හා වගකීම් පහක් පහත දැක්වේ.

A – පවින් වැළැක්වීම
B – යහපතෙහි යෙදවීම
C – මැනවින් ශිල්ප ඉගැන්වීම
D – නිරන්තර රැකවරණය සැලසීම
E – සුදුසු කල ආවාහ විවාහ කරදීම

ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් දකුණු දිශාව ලෙස සැලකෙන ගුරුවරුන් විසින් ඉටු කළ යුතු යුතුකම් පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) A හා B
(2) A හා C
(3) A හා D
(4) C හා D
(5) D හා E

**28.** උපතිස්ස කෝලිත දෙදෙනා සංජය පිරිවැජියාගේ ශ්‍රාවකභාවයෙන් ඉවත්ව බුද්ධ ශ්‍රාවකයන් බවට පත් වූහ. එසේ ඉවත්වීමට බලපෑ ප්‍රමුඛ හේතුව කුමක් ද?

(1) මොවුන් දෙදෙනා මෙතෙක් සොයන ලද විමුක්ති මාර්ගය අනාවරණය වීම
(2) සංජය පිරිවැජියාගේ ප්‍රතිපදාව පිළිබඳ ඇති වූ සැකය හා අසන්තෘප්තිය
(3) අස්සජි හිමියන්ගේ සන්සුන් ඉරියව් හා ප්‍රසන්නභාවය කෙරෙහි පැහැදීම
(4) බුදුරදුන්ගේ අග්‍රශ්‍රාවක තනතුරු පිළිබඳ වගකීම භාරගැනීම
(5) අස්සජි හිමියන් දෙසූ ධර්මය අසා රහත්භාවයට පත්වීම

**29.** දෙවන ධර්ම සංගායනාවෙන් පසු දසදහසක් පමණ භික්ෂූන් සසුනෙන් නෙරපීම හෝ වෙන්ව යාම කෙරෙහි බලපෑ ආසන්නතම හා තීරණාත්මක සාධකය වන්නේ

(1) එම භික්ෂූන් බුද්ධ දේශිත විනය ප්‍රඥප්තීන් නොපිළිගැනීමයි.
(2) ඔවුන් විසින් පිළිපදින ලද දස වස්තුව ධර්ම විනය විරෝධී යැයි සංඝයා විසින් තීරණය කිරීමයි.
(3) කාලීන අවශ්‍යතාවලට ගැළපෙන පරිදි විනය ප්‍රඥප්තීන් සංශෝධනය කිරීමට ඔවුන් තුළ තිබූ අවශ්‍යතාවයි.
(4) කොසඹෑ නුවර ප්‍රාදේශීය දේශපාලන නායකයන් මහාසංඝික නමින් වෙනම ජනප්‍රිය බෞද්ධ සම්ප්‍රදායක් පිහිටුවා ගැනීමට අනුග්‍රහය දැක්වීමයි.
(5) රහතන් වහන්සේලා විසින් අත්පත් කරගෙන තිබූ බුදුසසුනේ නායකත්වය හා භාරකාරත්වය නොපිළිගැනීමයි.

**30.** තෙවන ධර්ම සංගායනාව පැවැත්වීම කෙරෙහි බලපෑ ආසන්නතම හේතුව ලෙස හඳුනාගත හැක්කේ

(1) ධර්ම විනය බෙහෙවින් පිරිහී පැවතීමයි.
(2) දේශීය හා ජාත්‍යන්තර වශයෙන් බුදුදහම ව්‍යාප්ත කිරීමේ අවශ්‍යතාවයි.
(3) ත්‍රිපිටකය අංග සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවයි.
(4) දුසිල් මහණුන් බහුලව සසුන්ගතව සිටීමයි.
(5) සංගායනාවක් පවත්වන ලෙස ධර්මාශෝක රජතුමා විසින් ඉල්ලා සිටීමයි.

**31.** ධර්මාශෝක රජතුමා බෞද්ධයකු වුව ද අන්‍යාගමිකයන්ට ද අවශ්‍ය පහසුකම් සලසා දුන් බවත්, ඔවුන්ට ද ආරාම පූජා කළ බවත් සඳහන් වනුයේ

(1) බරාබර් ගුහා ලිපියෙහි ය.
(2) 13 වන ගිරි ලිපියෙහි ය.
(3) කාල්සි ගිරි ලිපියෙහි ය.
(4) ගිරිනාර් ගිරි ලිපියෙහි ය.
(5) මස්කි ගිරි ලිපියෙහි ය.

**32.** නාලන්දා විශ්වවිද්‍යාලයේ පරිපාලන ව්‍යුහයට අනුව සෑම ශිෂ්‍යයකුගේ ම විනයානුකූල හැසිරීම පිළිබඳ භාරකාරත්වය පැවරුණේ

(1) ද්වාර පණ්ඩිතට ය.
(2) විනය පාලකවරයාට ය.
(3) පෞද්ගලික ආචාර්යවරයාට ය.
(4) කුලපති හිමියන්ට ය.
(5) පාලක සභාවට ය.

33. ප්‍රාග් බෞද්ධ යුගයේ ලක්දිව පැවති ඇදහිලි හා විශ්වාස පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A – කාලවේල යක්ෂයාගේ දෙවොල නුවරට නැගෙනහිර දිසාවේ පිහිටියේ ය.
B – චිත්තරාජ යක්ෂයාගේ දෙවොල අභය වැවේ යටි කොණේ පිහිටියේ ය.
C – වලවාමුඛී යක්ෂණියගේ දෙවොල රජ ගෙළයන ඇතුළත පිහිටියේ ය.
D – වෛශ්‍රවණ දෙවියාගේ දෙවොල නුග ගසක පිහිටියේ ය.
E – ව්‍යාධ දෙවියාගේ දෙවොල තල් ගසක පිහිටියේ ය.

ඉහත ප්‍රකාශ අතුරින් නිවැරදි වන්නේ

(1) A පමණි.
(2) A හා B පමණි.
(3) A, B හා C පමණි.
(4) A, B, C හා D පමණි.
(5) A, B, C, D හා E යන සියල්ලම ය.

34. මිහිඳු මාහිමියන්ගේ ආගමනයෙන් දෙවන දිනයේදී පේතවත්ථු හා විමානවත්ථු තේමා කොට ගෙන රජගෙදර කාන්තාවන්ට දහම් දෙසීම, තත්කාලීනව ජනප්‍රියව පැවති යම් ආගමික විශ්වාසයකට අනුගතව සිදුකරන ලද දේශනාවක් ලෙස සැලකිය හැකි ය. මෙම සන්දර්භයෙහිලා පහත සඳහන් ප්‍රකාශ අතුරින් වඩාත් නිවැරදි වන්නේ,

(1) මළවුන් ඇදහීම එකල ජනප්‍රිය ඇදහිල්ලක්ව පැවති බවයි.
(2) මළවුන්ට පිං දීමේ ක්‍රමය ප්‍රාග් බෞද්ධ ලංකාවේ ජනප්‍රියව පැවති බවයි.
(3) පරලොව යන අය දිව්‍ය ලෝකවල හා ප්‍රේත ලෝකවල පමණක් උපදින බවට තිබූ විශ්වාසයයි.
(4) පේතවත්ථු හා විමානවත්ථු දේශනා පිළිබඳ තත්කාලීන ශ්‍රී ලාංකේය ජනතාව යම් අවබෝධයකින් සිටි බවයි.
(5) මළවුන් ඇදහීම ශ්‍රී ලාංකේය ජනතාව තුළ ජනප්‍රිය කිරීමට මිහිඳු හිමියන් තුළ අපේක්ෂාවක් පැවති බවයි.

35. "මහවෙහෙර වැසි මහණුන්හට අහරක් දුනහොත් සියක් දඩ" යැයි ආඥාවක් නිකුත් කළ අනුරාධපුර පාලකයා වූයේ

(1) එළාර රජු ය.
(2) වළගම්බා රජු ය.
(3) මහසෙන් රජු ය.
(4) වෝහාරිකතිස්ස රජු ය.
(5) ශිලාකාල රජු ය.

36. අනුරාධපුර යුගයේ මුල්ම කාලයේදී ඉදි වූ බවට මහාවංසාදී ඓතිහාසික වාර්තාවල දැක්වෙන විහාරාරාම නාමයන් පහක් පහත දැක්වේ.

A – ථූපාරාමය
B – ඉසුරුමුනි විහාරය
C – ප්‍රාචීනාරාමය
D – හත්ථාල්හක මෙහෙණවර
E – අටසැට ලෙන්

ඉහත සඳහන් විහාරාරාම අතුරින් දේවානම්පියතිස්ස රජතුමා විසින් ඉදිකරන ලද විහාර ලෙස පිළිගනු ලබන්නේ

(1) A පමණි.
(2) A හා B පමණි.
(3) A, B හා C පමණි.
(4) A, B, C හා D පමණි.
(5) A, B, C, D හා E යන සියල්ලම ය.

37. අතීත ශ්‍රී ලාංකේය පාලකයන් හා බුදුසමය අතර පැවති සම්බන්ධතා තහවුරු කරන පහත සඳහන් ප්‍රකාශ අතුරින් **සාවද්‍ය** ප්‍රකාශය කුමක් ද?

(1) එළාර රජු සෑගිරියට ගොස් සංඝයා බැහැ දැක දානයට ඇරයුම් කළේ ය.
(2) මහාදාඨික මහානාග රජු පැරණි රජ දරුවන් හා තම සොහොයුරා විසින් පනවා තිබුණු ආගමික පිළිවෙත් සියල්ලක් ම පිළිගත්තේ ය.
(3) කීර්ති ශ්‍රී මේඝවර්ණාභය රජු මිහිඳු උළෙල අරඹා අවුරුද්දක් පාසා පවත්වාගෙන යා යුතු යැයි ආඥා කළේ ය.
(4) නිශ්ශංකමල්ල රජු තුන් නිකාය සමගි කොට සසුන පිරිසිදු කළේ ය.
(5) IV වන මිහිඳු රජු "ලක්දිව පාලකයා බෝධිසත්ත්වයකු විය යුතු ය"යැයි ප්‍රකාශ කළේ ය.

38. 'අභයදාන' යනු

(1) බියට පත් සත්ත්වයන්ට පිහිටවීමයි.
(2) අභය භූමිවල වෙසෙන සතුන් පෝෂණය කර රැකබලා ගැනීමයි.
(3) දන් පිං කිරීමට නිර්භයව ඉදිරිපත් වීමයි.
(4) මරණ බිය නැති කොට ජීවත්වීමේ අයිතිය සුරක්ෂිත කිරීමයි.
(5) සියලු සතුන් වෙත මෙත් වැඩීමයි.

**39.** 'ප්‍රාප්ති දානය' යනුවෙන් අදහස් කරන්නේ
(1) තමාගේ පරලොව ජීවිතය සුගතිගාමී කර ගැනීම පිණිස දෙනු ලබන දානයයි.
(2) කෙනෙකුගේ මරණයෙන් පසු සත්දින, තෙමස් ආදී වශයෙන් සිදුකරනු ලබන දානයයි.
(3) තමා විසින් සිදු කරනු ලබන පිං අන් කෙනෙකු වෙත පැමිණවීමයි.
(4) අනුන් විසින් සිදුකරනු ලබන පිං තමා අනුමෝදන් වීමයි.
(5) උපසපන් භික්ෂූන් හතර නමක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් වෙත සිදුකරනු ලබන සඟසතු දානයයි.

**40.** අතීතයේ පටන් ශ්‍රී ලාංකේය භික්ෂූන් වහන්සේ රාජ්‍ය පාලන කටයුතු සඳහා සෘජු දායකත්වයක් දැක්වූ බව ඓතිහාසික වාර්තා හා සාධකවලින් පැහැදිලි වේ. ඒ අනුව අනුරාධපුර යුගයේ විසූ භික්ෂූන් වහන්සේ විසින් සිදු කරන ලද පහත සඳහන් කාර්යභාරයන් අතුරින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලනයට සෘජුව ම අදාළ **නොවන** කරුණ වන්නේ
(1) පාලකයාගේ අනුශාසකත්වය දැරීමයි.
(2) සතුරු උවදුරුවලින් රට නිදහස් කර ගැනීමේදී පෙරමුණ ගෙන කටයුතු කිරීමයි.
(3) රජවරුන් අතර පැවති ගැටුම් නිරාකරණය සඳහා සෘජුව මැදිහත් වීමයි.
(4) පාලකයන් පත් කිරීමට මෙන් ම ඇතැම් අධාර්මික පාලකයන් නෙරපීමට ද ඉදිරිපත් වීමයි.
(5) මිථ්‍යා දෘෂ්ටිකයන් සසුනින් නෙරපා ශාසන ශෝධනය පිණිස අනුග්‍රහය දැක්වීමයි.

**41.** බුදුසමයේ ආභාසය ලැබීමෙන් කුලභේදය සහමුලින් ම තුරන් වූ රට කුමක් ද?
(1) ථායිලන්තය (2) බුරුමය
(3) චීනය (4) ජපානය
(5) ලංකාව

**42.** බුදුදහම පැතිරිගිය ආසියාතික රටවලට අදාළ ප්‍රකාශ පහක් පහත දැක්වේ.
A – රජතුමා කිසියම් විහාරයක කඨින පිංකමකට වාර්ෂිකව සහභාගීවීම අනිවාර්ය කටයුත්තකි.
B – ලොකු කුඩා බොහෝදෙනාගේ ගෙලෙහි බුදු රුවක් පැළඳ සිටීම සුලභ දසුනකි.
C – බුදුදහමේ ආභාසයෙන් මල් සැකසුම් කලාව දියුණු විය.
D – ධර්ම ග්‍රන්ථ පරිවර්තන කාර්යය සඳහා වියත් භික්ෂූහු භාරතයේ සිට පැමිණියහ.
E – පැගෝඩා නමින් හඳුන්වන දාගැබ් නිර්මාණයට සුවිශේෂ තැනක් හිමි විය.

ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් ථායිලන්තයට පමණක් අදාළ ප්‍රකාශ ඇතුළත් වරණය කුමක් ද?
(1) A හා B (2) A හා C
(3) B හා C (4) B හා E
(5) C හා D

**43.** සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ බුද්ධත්වයට පත් වූ දිනය සැමරීමට ජපානයේ ආරම්භ වූ උත්සවය හැඳින්වූයේ කුමන නමකින් ද?
(1) හනමත්සුරි (2) ඔබොන්
(3) ජෝදෝ (4) චානෝයු
(5) සෙත්සුබුන්

**44.** පහත දැක්වෙන්නේ බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන් පූජනීය චරිත පහකි.
A – බුද්ධ
B – පච්චේකබුද්ධ
C – අරහන්ත
D – බෝධිසත්ත
E – චක්කවත්තිරාජා

මෙම චරිත අතුරින් මහාපරිනිබ්බාන සූත්‍රයේ දක්වන ලද ථූපාරහ පුද්ගලයෙක් **නොවන** චරිතය ඇතුළත් වරණය කුමක් ද?
(1) A, B හා C (2) A, B හා E
(3) A, C හා E (4) B, C හා D
(5) B, C, හා E

**45.** ඇතැම් ස්තූපවල ගර්භයට සම්බන්ධ කොට සිව් දිශාවට මුහුණලා නිර්මාණය කොට ඇති කලාත්මක බවින් යුත් අලංකාර තොරණක් වැනි අංගය හඳුන්වන්නේ

(1) වටදාගෙය නමිනි.
(2) වාහල්කඩ නමිනි.
(3) චෛතියඝර නමිනි.
(4) මලසුන් ගෙය නමිනි.
(5) මකර තොරණ නමිනි.

**46.** බුද්ධ ප්‍රතිමා නිර්මාණය පළමුව මථුරා සම්ප්‍රදාය මගින් සිදුකරන ලදැ යි පැවසුවේ කවුරුන් විසින් ද?

(1) වින්සන්ට් ස්මිත්
(2) පර්සි බ්‍රවුන්
(3) ෆූෂේ
(4) ආනන්ද කුමාරස්වාමි
(5) සෙනරත් පරණවිතාන

**47.** හිස්තැනට වඩාත් සුදුසු පිළිතුර සඳහන් වරණය තෝරන්න.

කලාත්මක බවින් උසස් ම ............................... අනුරාධපුරයේ රත්න ප්‍රාසාදය නම් ගොඩනැගිල්ල සමීපයේ දක්නට ලැබේ.

(1) කොරවක්ගල
(2) සඳකඩපහණ
(3) මුරගල
(4) පියගැටපෙළ
(5) වාහල්කඩ

**48.** කෝට්ටේ යුගය සිංහල පද්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස සලකනු ලබන අතර, පහත කෘති අතුරින් එම යුගයට අයත් **නොවන** කෘතියක් ලෙස හඳුනාගත හැක්කේ

(1) ගුත්තිල කාව්‍යයයි.
(2) කාව්‍යශේඛරයයි.
(3) බුදුගුණාලංකාරයයි.
(4) කව්සිළුමිණයි.
(5) ලෝවැඩ සඟරාවයි.

**49.** පැරණි ශ්‍රී ලාංකේය ජනයා විසින් විවේක සුවය හා ධාර්මික විනෝදාස්වාදය උදෙසා කවි ගායනය සිදු කරන ලදී. ඒ අනුව තුන්සරණේ කවි ගායනය බහුලව සිදුවූයේ කුමන අවස්ථාවලදී ද?

(1) දෛනිකව සිදුකරන ලද බුද්ධ වන්දනා හා බෝධි පූජා අවස්ථාවලදී
(2) බෞද්ධ පෙරහැර පැවැත්වීමේදී
(3) සිරිපා කරුණා කිරීමේදී
(4) විහාරස්ථාන ආශ්‍රිතව සිදුකරනු ලබන ශ්‍රමදාන අවස්ථාවලදී
(5) සාම්ප්‍රදායික මංගල චාරිත්‍රවලදී

**50.** වහලය ද ඇතුළත්ව සමස්ත ගොඩනැගිල්ල ම ගඩොලින් නිමවන ලද පිළිම ගෙවල් හඳුන්වන ලද්දේ

(1) ගෙඩිගේ නමිනි.
(2) පාසාද නමිනි.
(3) ගන්ධකුටි නමිනි.
(4) ටැම්පිට විහාර නමිනි.
(5) අඩ්ඩයෝග නමිනි.

* * *

Past Papers Wiki



සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

බෞද්ධ ශිෂ්ටාචාරය II
பௌத்த நாகரிகம் II
Buddhist Civilization II

45 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

※ **I කොටසින්** ප්‍රශ්න **දෙකක්** ද, **II කොටසින්** ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

1. (i) වෛශ්‍ය වර්ණයට අයත් ස්වධර්ම අතුරින් ආර්ථික ක්ෂේත්‍රයට සෘජුව ම සම්බන්ධ ස්වධර්ම **හතරක්** නම් කරන්න. (ලකුණු 02යි.)
   (ii) ගෘහස්ථ ආශ්‍රමයට අයත් කාර්යයන් කෙටියෙන් හඳුන්වා දෙන්න. (ලකුණු 03යි.)
   (iii) මගධ රාජ්‍යය හා බුදුරදුන් අතර පැවති සම්බන්ධය සාධක **හතරක්** ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 04යි.)
   (iv) බුද්ධකාලීන භාරතීය සමාජය තුළ කෘෂිකර්මාන්තය ජනප්‍රියව පැවති වෘත්තියක් බව සාධක **පහක්** ඇසුරින් කෙටියෙන් පහදන්න. (ලකුණු 05යි.)
   (v) අජිත කේශකම්බල ශාස්තෘවරයාගේ මූලික ඉගැන්වීම් ගෙනහැර දක්වන්න. (ලකුණු 06යි.)

2. (i) බුද්ධකාලීන ශ්‍රමණ ගුරුකුල **හතරක්** නම් කරන්න. (ලකුණු 02යි.)
   (ii) ශ්‍රමණ සම්ප්‍රදාය සතු පොදු ලක්ෂණ **තුනක්** ගෙනහැර දක්වන්න. (ලකුණු 03යි.)
   (iii) 'සත්ථා දේවමනුස්සානං' බුදුගුණය උදාහරණ **දෙකක්** ඇසුරින් හඳුන්වන්න. (ලකුණු 04යි.)
   (iv) අනේපිඬු සිටුතුමාගේ චරිතයෙහි කැපී පෙනෙන බෞද්ධ සාරධර්ම ඇගයීමට ලක් කරන්න. (ලකුණු 05යි.)
   (v) හොඳ-නරක ක්‍රියා විනිශ්චයෙහිලා බුදුසමය ස්වච්ඡන්දතාවට ලබා දී ඇති තැන පැහැදිලි කරන්න. (ලකුණු 06යි.)

3. (i) "න පරෙසං විලොමානි" යන ධම්මපද ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 02යි.)
   (ii) ඉහත 3 (i) හි සඳහන් ගාථාවේ අර්ථය නිවැරදිව ලියා දක්වන්න. (ලකුණු 03යි.)
   (iii) සිත, කය, වචනය යන තුන්දොරින් සිදුවන දස අකුසල් වෙන් වෙන්ව දක්වන්න. (ලකුණු 04යි.)
   (iv) බුදුසමයේ ශීඝ්‍ර ව්‍යාප්තියට බුද්ධකාලීන රජවරුන්ගෙන් ලැබුණු දායකත්වය, යටත් පිරිසෙයින් රජවරු දෙදෙනෙකුවත් ඇතුළත් වන සේ, සාධක **පහක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05යි.)
   (v) සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන භෝග විනාශමුඛ **හය** හඳුන්වා දෙන්න. (ලකුණු 06යි.)

PAST PAPERS WIKI

[දෙවැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

## II කොටස

**4.** (i) පැරණි භාරතීය බ්‍රාහ්මණ ආගමික ඉගැන්වීම්වල ඇතුළත් වර්ණ ධර්ම සංකල්පය කෙටියෙන් පැහැදිලි කර, ඒ පිළිබඳ බෞද්ධ විග්‍රහය ගෙනහැර දක්වන්න. (ලකුණු 10යි.)

(ii) ශ්‍රමය හා ධනය අතර පැවතිය යුතු ධාර්මික සබඳතාව බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

**5.** (i) සෞන්දර්ය රසාස්වාදය පිළිබඳ බුදුසමයේ ආකල්පය සාධක **පහක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 10යි.)

(ii) පැරණි ලක්දිව ආගමික ගොඩනැගිලි දොරටු ආශ්‍රිත කලාංග පිළිබඳ ප්‍රමාණවත් විවරණයක් සපයන්න. (ලකුණු 10යි.)

**6.** (i) දෙවන ධර්ම සංගායනාව ශාසන ඉතිහාසයෙහි සන්ධිස්ථානයක් ලෙස සැලකීමේ යුක්තිසහගත බව පෙන්වා දෙන්න. (ලකුණු 10යි.)

(ii) පැරණි භාරතීය අධ්‍යාපන ආයතනයක් ලෙස නාලන්දා විශ්වවිද්‍යාලයට හිමිව තිබූ තැන නිදසුන් මගින් ප්‍රකට කරන්න. (ලකුණු 10යි.)

**7.** (i) ප්‍රාග්බෞද්ධ ලක්දිව ප්‍රචලිතව පැවති ආගමික ඇදහිලි හා විශ්වාස නම් කොට ඒ අතුරින් භාරතීය සම්භවයක් සහිත ආගම් පිළිබඳ විවරණයක් කරන්න. (ලකුණු 10යි.)

(ii) මහාවිහාරයට අභියෝගාත්මකව අභයගිරි සම්ප්‍රදාය සංවර්ධනය වූ අයුරු නිදසුන් මගින් පෙන්වා දෙන්න. (ලකුණු 10යි.)

**8.** (i) මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් උද්ගතව ඇති පාරිසරික ගැටලු අවම කර ගැනීම සඳහා බෞද්ධ ඉගැන්වීම් උපයෝගී කරගත හැකි ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 10යි.)

(ii) පහත සඳහන් මාතෘකා අතුරින් **දෙකකට** විවරණ සපයන්න.

(1) මව්පිය උපස්ථානය

(2) බුද්ධ ප්‍රතිමාවේ මුද්‍රා

(3) ලෝවැඩ සඟරාව

(4) දස සක්විති වත් (ලකුණු 05× 2 = 10යි.)

* * *

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library